(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 438.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 මාර්තු මස 04 වැනි බදාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4533/'13

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 අය - වැය මගින් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතුවූවන්ගේ පවුල්වල ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා එම පවුල්වල තුන්වැනි දරුවාගේ උපත වෙනුවෙන් රුපියල් ලක්ෂයක දීමනාවක් ලබා දෙන බවට යෝජනා කළ බව දන්නේද;

(ii) එම යෝජනාවට අනුව 2011, 2012, 2013 සහ 2014 වර්ෂවල එම දීමනාව ලබා දී ඇති පවුල් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා රජය විසින් දරනු ලැබූ සමස්ත වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතුවූවන්ගේ පවුල්වල තුන්වැනි දරුවාගේ උපත සඳහා රුපියල් ලක්ෂයක දීමනාවක් ලබාදීමේ වැඩ පිළිවෙළ මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) මේ වනවිටත් පොලිස් සේවයේ නියුතුවූවෙකු විසින් ඉහත මුදල ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4778/'14

2.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති සමස්ත රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) පළාත් සභා යටතේ ඇති රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iii) 2012 අයවැය මගින් පළාත් සභා යටතේ වන රෝහල්වල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා වූ වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබේද;

(iv) එම වැඩ සටහන් යටතේ පළාත් සභා මගින් ප්‍රාදේශීය රෝහල් සඳහා අවශ්‍ය නොවන උපකරණ බෙදා හැර තිබූ බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අ (iii)හි සඳහන් වැඩ සටහන යටතේ පළාත් සභා රෝහල් සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණය එක් එක් පළාත් සභාව අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5093/'14

3.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ දී, ශ්‍රී ලංකා රජය විසින් මාලදිවයින් රජය වෙත යම් මූල්‍යමය ආධාර කිරීමක් හෝ ව්‍යාපෘති සඳහා ආධාර කිරීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම ආධාරවල මූල්‍ය වටිනාකම කොපමණද;

(iii) එම රට වෙත යම් ඉදිකිරීම් ව්‍යාපෘතියක් ලබා දී තිබේ නම්, එම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබූ ආකාරය කවරේද;

(iv) එම මූල්‍යමය ආධාර හෝ ව්‍යාපෘති ආධාර ලබා දීමේ අරමුණ කවරේද;

(v) ශ්‍රී ලංකා රජය විශාල විදේශ ණය ප්‍රමාණයක් ගෙවීමට තිබියදී, ඉහත පරිදි වෙනත් රටකට ආධාර ලබා දීම නිශ්ඵල ක්‍රියා මාර්ගයක් නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5118/'14

4.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුකුලේගඟ විදුලි බලාගාරයෙහි තිබෙන විදුලි උත්පාදන යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් යන්ත්‍රයෙහි විදුලි උත්පාදන ධාරිතාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2013 වර්ෂය මුළුල්ලේ ඉහත සඳහන් සියලු විදුලි උත්පාදන යන්ත්‍ර ක්‍රියාත්මකව පැවතියේද;

(ii) නොඑසේ නම්, අක්‍රියව පැවති යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් යන්ත්‍රය අක්‍රියව තිබූ කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම විදුලි උත්පාදන යන්ත්‍ර අක්‍රියවීමට හේතු කවරේද;

(v) අනාගතයේදී එම බලාගාරයේ යන්ත්‍ර අක්‍රිය නොවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5444/'14

5\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රෙජිමේන්තු අංක සෙ/5 A02691 දරන ලාන්ස් කෝප්‍රල් එස්. පී. කේ. වන්නිආරච්චි යන අය ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී, 2007.05.25 වැනි දින මිය ගිය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත නම් සඳහන් මිය ගිය යුධ හමුදා සාමාජිකයාගේ බිරිඳට ලැබිය යුතු වැටුප් ගෙවීම 2013 ජනවාරි මස සිට නතර කර තිබේද;

(ii) ඔහුගේ පෙර විවාහක බිරිඳ විසින් පසුව විවාහ වූ බිරිඳට සහ දරුවාට අදාළ වැටුප් ලබා දීමට අකමැත්තක් නොමැති බව ලිඛිතව දැනුම් දී තිබේද;

(iii) එම මියගිය යුධ හමුදා සාමාජිකයාගේ බිරිඳ වන හේමන්ති ප්‍රියදර්ශනි නැමැත්තියට වැටුපෙන් 50%ක් සහ දරුවාට 50% ක් ලෙස නැවත වැටුප් ගෙවීම ආරම්භ කර ඇතත්, මේ වන විට ගෙවනු ලබන්නේ මුල් අවස්ථාවේ ගෙවන ලද මුළු වැටුපෙන් අඩක් පමණක් බව දන්නේද;

(iv) ඉහත (iii) හි සඳහන් පරිදි එම රණවිරුවාට හිමි මාසික වැටුපෙන් අඩක් පමණක් ගෙවීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5768/'14

6\.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කඩහපොල - රඹාවැව මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළ වන මාර්ගයේ දුර සහ පළල කොපමණද;

(ii) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගත වන කාල සීමාව කවරේද;

(iii) එම මාර්ගයේ ඉදිකිරීම්කරු තෝරාගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් මගින්ද;

(iv) එසේ නම්, තෝරාගනු ලැබූ ලංසුකරුගේ/ආයතනයේ නම කවරේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබා ගන්නා මූලාශ්‍ර කවරේද;

(vi) එම මාර්ගයේ එක් කිලෝමීටරයක් ඉදිකිරීම සඳහා වන පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන කාලය තුළ රථ වාහන පාලනය සඳහා වැඩ පිළිවෙළක් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, සම්පූර්ණ ව්‍යාපෘතිය තුළින් ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී, අගතියට පත්වන පාර්ශ්වකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ අගතියට පත් වී ඇති අයට වන්දි ප්‍රදානය කර තිබේද;

(iii) එසේ නම්, වන්දි ලබා දුන් අයගේ විස්තර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5858/’15

7\.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට රට තුළ දෛනිකව භාවිතා කරන ඩීසල්, පෙට්‍රල් සහ භූමිතෙල් යන ඉන්ධන වර්ගවල සාමාන්‍ය අගය ලීටර් කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් ඉන්ධන වර්ගය සඳහා දැනට අයකරන බදු ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉදිරි කාලය තුළ ජනතාවට සහනයක් ලැබෙන පරිදි එකී බදු ඉවත් කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ අනුව එම එක් එක් ඉන්ධන ලීටරයක් සඳහා නියමිත වෙළඳපොළ මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4534/’13

8\.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1980 ජූලි වර්ජනයේදී රැකියා අහිමි වූ, මෙතෙක් සහනයක් නොලැබුණු පුද්ගලයින්ට රු.5000.00ක දීමනාවක් ලබා දෙන බවට වූ 2013 අය - වැය යෝජනාව අනුව, මේ දක්වා එම දීමනාව ලබා දී ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දීමනාව ලබා දීම සඳහා රජය විසින් මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරීම ආරම්භ වන විට කිසිදු ප්‍රතිලාභයක් නොලබාම මිය ගොස් සිටි ජූලි වර්ජකයින්ට හිමි එකී ප්‍රතිලාභය අදාළ හිමිකරුවන් වෙත ලබා දීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) 1980 ජූලි වර්ජනයට සහභාගී වී මෙතෙක් සහනයක් නොලැබූ අයකු ඉහත සඳහන් මුදල ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4780/’14

9\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට ලියාපදිංචි කර ඇති සමස්ත ඖෂධ සංඛ්‍යාව කොපමණද;

(ii) ඖෂධ ලියාපදිංචි කිරීම සඳහා ක්‍රියාත්මක වන වත්මන් ක්‍රමවේදය කවරේද;

(iii) ඖෂධ ලියාපදිංචි කිරීම පාලනය කිරීම සඳහා යම්කිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5095/'14

10.

ගරු අනුර දිසානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ ශ්‍රී ලංකා රජයට, විදේශ කටයුතු අමාත්‍යාංශයට හෝ කවර හෝ තානාපති කාර්යාලයකට, විදේශ රටවල් තුළ මෙරට කෙරෙහි ධනාත්මක ආකල්ප ගොඩනැගීම වෙනුවෙන් උපදෙස් ලබාදීම සඳහා කවර හෝ විදේශ සමාගමක සේවය ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම සමාගමේ නම කවරේද;

(iii) එම සමාගම අයත් රට කවරේද;

(iv) එම සමාගම තෝරා ගනු ලැබූ ආකාරය කවරේද;

(v) එවැනි සමාගමක සේවය ලබා ගැනීමේ අරමුණු කවරේද;

(vi) ඉහත සඳහන් කටයුතු වෙනුවෙන් එකී සමාගමට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) ඊට අදාළව මුදල් වැය කිරීම සිදු කළ වැය ශීර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5120/'14

11.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 / 2014 වර්ෂවලදී විශ්වවිද්‍යාල සිසුන් සඳහා නේවාසිකාගාර 60 ක් ඉදිකිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යම් ආයතන හා ගිවිසුම්ගත වී තිබේද;

(ii) එසේ නම්, එම ඉදිකිරීම්වලට අදාළව ගිවිසුම් ඇති කර ගත් ආයතන කවරේද;

(iii) එම ඉදිකිරීම් ආයතන තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටි අනුගමනය කරනු ලැබුවේද;

(iv) නොඑසේ නම්, එම ආයතන තෝරා ගැනීමට පාදක කරගත් කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් ආයතනයට ඉදිකිරීමට ලබා දී ඇති නේවාසිකාගාර සංඛ්‍යාව සහ එම ඉදිකිරීම්වලට අදාළව ගිවිසුම්ගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් ගිවිසුම්කරු විසින් නේවාසිකාගාර ඉදිකිරීම අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

(iii) ඉදිකරනු ලබන එක් එක් නේවාසිකාගාරයේ නේවාසික පහසුකම් ලබාදීමට හැකි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වැය කරන මුදල කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4781/'14

12\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින තුළ මේ වන විට ඖෂධ මිල පාලනයක් ක්‍රියාත්මක වන්නේද;

(ii) කලකට පෙර දී ශ්‍රී ලංකාව තුළ ඖෂධ මිල පාලනයක් ක්‍රියාත්මක වූ බව දන්නේද;

(iii) එසේ නම්, එම මිල පාලනය ක්‍රියාත්මක වූ කාල සීමාව කවරේද;

(iv) එම කාල සීමාව තුළදී මිල පාලනය සිදු කළ ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(v) ඖෂධ මිල පාලනය සඳහා පත් කර ඇති කමිටුව මේ වන විට ඊට අදාළ නිර්දේශ ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4819/'14

13\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් කුලී පදනම මත ලබා ගත් වායු සමනය කළ සුඛෝපභෝගී වාහන ගුවන් හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා ගන්නා බවත්;

(ii) එම වාහන සඳහා ඉන්ධන රජයෙන් ලබා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබා ගත් සුඛෝපභෝගී වාහන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ එකඟතාවය ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, එම වාහන පරිහරණය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5096/'14

14\.

ගරු අනුර දිසානායක මහතා,— ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 අයවැය ලේඛනය මඟින් ලෝක ආහාර සංවිධානය වෙත පරිත්‍යාග කරනු ලබන බවට යෝජනා කළ සහල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අනුව, මේ වන විට පරිත්‍යාග කර ඇති සහල් ප්‍රමාණය කොපමණද;

(iii) එම සහල් තොගය මිලදී ගනු ලැබුවේ කුමන ආයතනයක් වෙතින්ද;

(iv) එම සහල් තොගය වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගනු ලැබුවේ නම්, ඒ සඳහා වී අලෙවි මණ්ඩලය විසින් වැය කළ මුදල කොපමණද;

(v) එම සහල් තොගය සඳහා වී අලෙවි මණ්ඩලය වෙත ලබා දී ඇති මුදල කොපමණද;

(vi) ඒ අනුව එම සහල් මෙට්‍රික් ටොන් එකක් සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5142/'14

15.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 අප්‍රේල් මස 30 වැනි දින සිට මේ දක්වා කාලය තුළ සිදු වූ දුම්රිය - දුම්රිය ගැටීම්, දුම්රිය පීලි පැනීම් හා දුම්රිය මැදිරි ගැලවීයාමට අදාළ අනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය අනතුරු සිදුවූ ස්ථාන, දිනය හා අනතුරුවල ස්වභාවය, මගීන්ට සිදුවූ හානි වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් දුම්රිය අනතුරු සිදු වීමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම අනතුරු හේතුවෙන් සිදු වූ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ආකාරයේ අනතුරු වළක්වා දුම්රිය ප්‍රවාහන සේවය මඟින් මහජනතාවට විශ්වාසනීය සේවයක් ලබාදීමට සැලසුම් කර තිබේද;

(ii) එම සැලසුම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— උපදේශක කාරක සභා,— තේරීම් කාරක සභාවේ තීරණය පරිදි මතු දැක්වෙන පරිදි උපදේශක කාරක සභා තිස් එකක් (31) පත් කළ යුතු ය.

පිළිවෙළින්:—

1. ආරක්ෂක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
2. මහවැලි සංවර්ධන හා පරිසර කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
3. ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
4. මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
5. ස්වදේශ කටයුතු හා ධීවර කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව

6. ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
7. විදේශ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
8. රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ උපදේශක කාරක සභාව
9. බුද්ධ ශාසන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
10. වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
11. මුදල් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
12. නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
13. විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
14. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
15. වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
16. මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
17. ඉඩම් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
18. නිවාස හා සමෘද්ධි කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
19. අධිකරණ හා කම්කරු සබඳතා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
20. ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
21. සංචාරක හා ක්‍රීඩා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
22. වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
23. කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
24. වතු යටිතල පහසුකම් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
25. නැවත පදිංචි කිරීම, ප්‍රතිසංස්කරණය හා හින්දු ආගමික කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
26. අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
27. විදේශ රැකියා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
28. අභ්‍යන්තර ප්‍රවාහන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
29. සමාජසේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
30. කාන්තා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව
31. මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව

අංක 109 දරන ස්ථාවර නියෝගය අනුව කාරක සභාව වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වාර්තා කිරීම සඳහා එක් එක් උපදේශක කාරක සභාව පස් දෙනෙකුට (5) නොඅඩු සහ විසිපස් දෙනෙකුට (25) නොවැඩි මන්ත්‍රීවරුන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

එක් එක් උපදේශක කාරක සභාවේ ගණපූරණය සඳහා මන්ත්‍රීන් තුන් දෙනෙකු (3) අවශ්‍ය විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2011.04.07 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2015 මාර්තු මස 06 වැනි සිකුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 2.30 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2015 මාර්තු මස 06 වැනි සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් තැබිය යුතු ය.

4.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"රවීචන්ද්‍ර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*3.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 02 දිනැති අංක 1900/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.02.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— එක්සත් ජාතීන්ගේ පනත යටතේ නියෝග,— 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 11 දිනැති අංක 1892/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*6.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

14.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

19.

මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

20.

අල් ජමියාතුල් ෆ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය'' යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---